# ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථාන සංචාරයක් (“Buddhist Circuit”) මිස රාමායණ සිද්ධස්ථාන සංචාරයක් නැත

**මහාචාර්ය ඔලිවර් අබේනායක**

ඉන්දියාවේ රාමායණ සංචාරක ජාලයක් ගැන කථාවක් නැත. එහෙත් බෞද්ධ සංචාරක ජාලයක් ගැන ඉන්දියානු සංචාරක මණ්ඩලය කථා කරයි. බෞද්ධ සංචාරක ජාලයේ බොහෝ තැන් 19 වන සියවසේ දී සොයා ගත්තේ ශ්‍රී ලාංකික මූලාශ්‍රය ඇසුරෙන් හින්දු අන්තවාදය බුද්ධගයාවේ ඇරඹුණු අරගලවල ප්‍රතිඵල වශයෙනි.

**ඉන්දියානු බෞද්ධ සංචාරක ජාලය**

මෙම ජාලය බුදුරදුන් උපන් ලුම්බිණියෙන් බෞද්ධ සිද්ධස්ථාන වන්දනය පෙරදැරි කොට ගෙන බුදුරජාණන් වහන්සේට පුද කොට ඇත. මෙම ජාලය බෞද්ධ මූලධර්ම වලට අනුගත වේ.

පහත දැක්වෙන ස්ථාන ඉන්දියාව ද ආසියානු රටවල් ද සංචාරක ව්‍යාපාරය සඳහා අනුමත කොට ඇත. මෙහි එන විස්තර එක එල්ලේ බෞද්ධ සංචාරක ජාලයෙන් ගත් ඒවාය.

**buddhistcircuit.com**

මෙම අන්තර්ජාලය BIMST-EC මගින් 2005 පෙබරවාරි 23 දින කළ වැඩමුළුවක දී විවිධ රටවල නියෝජිතයන් මගින් පිළියෙළ කරන ලදි. ඒ සඳහා ඉන්දියාව, භූතානය, බංගලාදේශය, මියන්මාර්, නේපාලය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය සහභාගි වූහ.

පෞද්ගලික අංශය බෞද්ධ සංචාරක ව්‍යාපෘතිවලට සහභාගි කරවා ගැනීම සඳහා ද ක්‍රියාන්විතයක් යෝජනා කරන ලදි. buddhistcuricuit.com එහි ප්‍රතිඵලයයි.

මෙම බෞද්ධ සංචාරක ජාලය ආසියාකරයේ සංචාරක ව්‍යාපාරය නංවාලීමේ අරමුණ ක්‍රියාවට නගයි.

BIMST-EC කවය බැංකොක්වල අරඹන ලද හෙයින් එම නම ලබයි. බංගලාදේශය, ඉන්දියාව, ශ්‍රී ලංකාව, තායිලන්තය යන රටවල ආර්ථික සහයෝගිතාව එමගින් බලාපොරොත්තු වේ.

**බෞද්ධ සංචාරක ජාලය නේපාලයේ වර්ධනය වීම**

බෞද්ධ සංචාරක ජාලය බුදුරදුන් හා සබැඳි ලුම්බිණි, සාරානාත්, බුද්ධගයා සහ කුසිනාරා යන ස්ථාන ද බුදුරදුන් සහ ශ්‍රාවකයන් ඇසුරු කළ අනෙක් ස්ථාන කේන්ද්‍ර කොට ඇත. ලෝකයේ සංචාරක ප්‍රවණතා ආසියාවේ වෙළඳ පොලට මාරුවෙමින් පවතී.

**ඉන්දියානු රජයේ බෞද්ධ සංචාරක ජාලය**

ඊට බුද්ධගයා, රාජ්ගීර්, නාලන්ද, පැට්නා, වෛශාලි, කුෂිනගර්, ලුම්බිණි යන ස්ථාන අයත් වේ. ඉන්දියානු බෞද්ධ සංචාරක ජාලයේ වැදගත් ස්ථාන විස්තර වේ. ඉන්දියානු බෞද්ධ සංචාරක ජාලය වන්දනා කළ හැකි ක්‍රමවේද විස්තර වේ.

**ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථාන හඳුනා ගැනීමට ශ්‍රී ලංකාවේ දායකත්වය**

ඉන්දියාවේ විවිධ බෞද්ධ සිද්ධස්ථාන හඳුනා ගැනීමට ඉන්දියාවේ ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස්ට ආධාර වූයේ 1837 දී කළ මහාවංස පරිවර්තනය සහ වස්කඩුවේ සුභූති ස්වාමීන් වහන්සේ සමග කළ ලිපි ගනුදෙනුය.

**බුද්ධගයාව සහ අනගාරික ධර්මපාල තුමා**

මෙහිදී මතකයට ගත යුතු දෙයක් නම් බුද්ධගයාව නිදහස් කර ගැනීම සඳහා හින්දු මූලධර්මවාදීන්ගේ විරුද්ධත්වය ද නොසලකා අනගාරික ධර්මපාලතුමා ගෙන ගිය අරගලයයි.